# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 14,896 — 1970 මාර්තු 5 වැනි බ්‍රහස්පතින්ද — 1970.3.5**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඬ කරන ලදි.)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 217 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| කනතුරු-ඇබෑර්තු ... ... ... | 218 | අය-වැය ලේඛන ... ... ... | 224 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 221 | දේපල විකිණීම ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 221 | මාර්ග කොමිටි දන්වීම ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දන්වීම ... | 223 | විවිධ දන්වීම ... ... ... ... | 225 |


## පළාත් පාලන නිවේදන

ඇල්. ඕ—ඕ 69/41

### ගම් සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 37 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති රණසිංහ ප්‍රේමදාස වන මම, මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම නැගෙනහිර ගම් ප්‍රදේශයේ ගම් සභාවට ඒ ගම් ප්‍රදේශයෙහි ඉඩම් බද්දක් ඒ වගන්තිය යටතේ පනවා අයකිරීමට මේ නිවේදනයෙන් බලය පවරමි.

ආර්. ප්‍රේමදාස,
පළාත් පාලන ඇමති.

1970.2.7 වැනි දින,
කොළඹ.

3-3—70.3.5 දින අංක 14,896 දරන ගැසට් පත්‍රය

### ගම්සභා ආඥාපනත
#### 13 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධිත) පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය) ගම්සභා ආඥාපනතේ 13(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර නුවරඑළිය පාලන දිස්ත්‍රික්කයේ සහකාර පළාත් පාලන කොමසාරිස් ලේකම්වසම් ගොඩ්වින් සිරිවර්ධන වන මම, නුවරඑළිය දිස්ත්‍රික්කයේ පල්ලෙපනේ ගම්සභාවේ අංක 10 දරණ කොට්ඨාශයේ නියෝජිත ජයසේකර මුදියන්සේලාගේ වන්නියාහේනේ මුදලිහාමි මහතා ගම්සභාවට දැන්වීමක් නොකර පිළිවෙළින් ගම්සභාවේ රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට තමන් තෝරාපත් කර ගැනීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමකට පත්ව නුවරඑළිය දිස්ත්‍රික්කයේ පල්ලෙපනේ ගම්සභාවේ අංක 10 දරණ කොට්ඨාශයේ නියෝජිත ජයසේකර මුදියන්සේලාගේ වන්නියාහේනේ මුදලිහාමි මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළකිරීමේ දින සිට තම සභිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

එල්. ජී. සිරිවර්ධන,
සහකාර පළාත් පාලන කොමසාරිස්,
නුවරඑළිය පාලන දිස්ත්‍රික්කය.

1970 ක්වූ ජනවාරි මස 20 දින,
නුවරඑළිය, පළාත් පාලන අමාත්‍යාංශ කායාර්ලයේදීය.

3-1—70.3.5 දින අංක 14,896 දරන ගැසට් පත්‍රය

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

# තනතුරු — ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

1. **දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, පළාත් පාලන සේවා ආඥාපනතේ (264 වැනි අධිකාරය) විධිවිධාන, ඒ පිළිබඳ සංශෝධන හා ඒ යටතේ සම්පාදික රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මය 3 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරන ලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනික් තනතුරුද ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සමාජිකයන් විසින් උසුලනු ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදාහරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට මාරු කර හරිනු ලැබූව හොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථාවේ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ 1948 අංක 8 දරණ පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1954 අංක 43 දරණ පළාත් පාලන සේවා ආඥාපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින්ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශික බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඇ) ස්ත්‍රීන්ද, වයස 55ට වැඩි නිලධාරීන්ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරින්ද ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කෙරෙන සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා 10,429 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය වැටුපෙන් සියයට 4 ක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බල මණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බල මණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක් මුදලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත් වන්නන්ට නියම කළ හැකිය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවන් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

4. **නව ප්‍රවේශක නිලධාරීහු.**—(i) අදාළ පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියම කොට නැත්නම් අවුරුදු 3ක් වන්නේය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහාත් විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ සම්පාදිත නියෝග හෝ මින් මතු සම්පාදනය කළ හැකි නියෝග වලටත් අනුකූලව ක්‍රියා කරන ලෙස "නව ප්‍රවේශක නිලධාරීන්වත්" නියම කරනු ලැබේ.

(iii) (අ) ස්වකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය ඇතුළත දී සිංහල භාෂාව විෂයෙහි ප්‍රවීණතාවක් ලබාගන්නා ලෙස මේ නිලධාරීන්ට නියම කරනු ලැබෙයි.

(ආ) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේ දී පත්වීම ස්ථිර කිරීම අනිකුත් කරුණු අතර, නියමිත කාල සීමාවන් තුළදී සිංහලය පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමාවන් තුළදී මේ ප්‍රවීණතා පරීක්ෂණයන් ගෙන් සමත්වීමට අපොහොසත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමිය හැකිවන අතර, නියමිත කාල සීමාවෙන් පසු වැඩිපුර කාලසීමාවක් ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමීම, වැටුප් වැඩිවීම නතර කිරීමක් බවට පරිවර්තනය කරනු ලැබේ. එසේ නතර කිරීම පරීක්ෂණයෙන් සමත් වනතුරු බලපවත්වනු ඇත. (අංක 13,387 සහ 62.11.9 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදළ වන පොදු කොන්දේසි බලන්න).

(ඇ) **අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථය අඩුම සුදුසුකම් වශයෙන් නියම කොට ඇත්තාවූ සෑම බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයකින් සම්මානයක් තිබිය යුතුය.

1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්ව වූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියා වූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදළ නොවේ.

(ඈ) **කාර්යක්ෂමතා කඩඉම.**—පත්වීම ස්ථිර කරන ලද දිනයේ සිට අවුරුදු 2 ක් ඇතුළතදී ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර තත්ත්වයේ සිංහල භාෂාව පිළිබඳ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සමත් වන ලෙස නව ප්‍රවේශක නිලධාරීන්ට නියම කරනු ලැබිය හැකිය. මේ පරීක්ෂණයෙන් සමත්වීමට අපොහොසත්වීමේ ප්‍රතිඵලය වනුයේ වැටුප් වැඩිවීම කල් දැමීමය.

(iv) පළාත් පාලන සේවයට ඇතුළුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා ගන්නා "නව ප්‍රවේශක නිලධාරීහු" සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙති.

(v) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේදී සිංහල ප්‍රවීණතාව පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණිය නොහැකි වුවහොත් අංක 21 සහ 22 දරණ පළාත් පාලන සේවා රෙගුලාසිවල සාමාන්‍ය විධි විධාන බලපවත්වනු ඇත.

(පහත සඳහන් (iii) (අ), (ආ) සහ (v) දරන කොන්දේසි දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් සේවයට බඳවා ගනු ලැබූවන් කෙරෙහි යෙදෙයි.)

සටහන 1.—මේ කරුණ සම්බන්ධයෙන් "නව ප්‍රවේශක නිලධාරී" යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන් ය.

සටහන 2.—රජයේ සේවයෙහි නියැලිව සිට පළාත් පාලන සේවයේ තනතුරු භාර ගැනීම සඳහා සේවයෙන් නිදහස් කරනු ලබන්නා වූ "ආදි ප්‍රවේශක නිලධාරීන්" කෙරෙහි ඉහත 4 වැනි ඡේදයේ (iii) (අ), (ආ) සහ (ඇ) හි සඳහන් විධිවිධාන අදළ නොවේ.

5. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින් ද, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචිකරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. **සේවා මුක්ත භටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවා මුක්ත වූ අයදුම්කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම් කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම අධ්‍යාපන සුදුසුකම් ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. **වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරන වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීය බල මණ්ඩලයන්හි සේවකයන්ට පුළුවන.

8. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුව හොත් ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදාගන්නට තමන් සූදානම්ව සිටිත් ද නැද්දැයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක්, අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වූව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාරි යෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම් පත්, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්‍යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම් පතක් තැපැලේදී, ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම් පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූද ඒ අවදානමට මුහුණ පාති.

අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත්

ආකෘතිය

## පළාත් පාලන සේවය

සැ. යු.–(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුරු අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනෙ හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර සභාපතිගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත් අයදුම්කරුවෝ ස්වකීය අයදුම්පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැළකිල්ල යොමු කරන්න.

————තනතුර සඳහා වූ අයදුම් පත

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැඳහුම් අංකයක් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස : අවුරුදු :————, මාස :————, දින :————.

(ආ) උපන් දිනය :—

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පියා සහ මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙනගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතන වල නම් :————.

10. ඉගෙන ගත් පාඨශාලා හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස් වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) : ————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාලසීමාවන් :————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රෙණිය හා ඊට පත්වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම් :
සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

**13. විශේෂ සුදුසුකම්.**—ගැසට් නිවේදනයෙහි සඳහන් නොකොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම් ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————

**14.** කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

**15.** මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කොතෙක් ද ? :————.

**16.** වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

**17.** චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛන ගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයාගනු ලැබුවහොත් මා නුසුදුස් සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
සභාපති,
තැපැල් පෙට්ටිය 530, කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### III වැනි ශ්‍රේණියේ විදුලිය අධිකාරී තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි. තෝරාගනු ලබන අයදුම්කරුවන්ගේ නම්, පත්වීම් පොරොත්තු ලේඛනයක ඇතුළත් කර, පළාත් පාලන සේවයේ පුරප්පාඩු ඇතිවන පරිදි පත්වීම් දෙනු ලැබේ.

**2. වැටුප.**—තනතුරට නියමිත ඒකාබද්ධ වැටුප් ක්‍රමය රු. 4,296—144×10—5,736 වේ. මෙම වැටුප් ක්‍රමයේ රු. 4,872 යන වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකි.

කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වූ III වැනි ශ්‍රේණියේ විදුලිය අධිකාරීන්, රු. 5,736 වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයක් සහිත රු. 5,016—144×11—රු. 6,600 යන ඒකාබද්ධ වැටුප් ක්‍රමයේ II වන ශ්‍රේණියේ විදුලිය අධිකාරීන්ගේ තනතුරු සඳහා උසස් කිරීමට සුදුස්සෝ වෙති.

**3. අවශ්‍ය සුදුසුකම්.**—70.3.24 දිනට වයස අවුරුදු 40 ට නොවැඩි බවට සෑම අයදුම්කරුවකු විසින් ම සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරුවන්ට පහත සඳහන් කාර්මික සුදුසුකම් තිබිය යුතුය :—

(i) කණිෂ්ඨ කාර්මික නිලධාරීන් සඳහා විදුලිය සහ යාන්ත්‍රික ලංකා කාර්මික විද්‍යාලයීය අවසාන සහතිකය ; **හෝ**

(ii) විදුලිය ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ලංකා කාර්මික විද්‍යාලයීය අවසාන සහතිකය (තුන් අවුරුදු සන්ධ්‍යා කාල) ; **හෝ**

(iii) ලන්ඩන්හි "සිටි ඇන්ඩ් ගිල්ඩ්ස්" විදුලිය ඉංජිනේරු ආයතනයේ දෙවැනි ශ්‍රේණියේ සහතිකය.

**4.** අවශ්‍ය කාර්මික සුදුසුකම් ඇති පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ අයදුම්පත්‍ර, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ. එබඳු අපේක්ෂකයින්ගේ අයදුම්පත්‍ර තමන් සේවය කරන ප්‍රාදේශීය බල මණ්ඩලයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

**5.** මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

**6.** ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට, 70.3.24 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

**7.** අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ **පෞද්ගලික නමට නොවේ.**

**8.** නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතු වූ පිළිගතහැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

**9.** සුදුසුකම් ලත් සියලුම අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බව සති 3 ක් ඇතුළතදී දන්වා එවනු ලැබේ.

ඒ. බී. සමරජීව,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1970 පෙබරවාරි මස 20 වෙනි දින,
තැ. පෙ. 530, කොළඹ,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

3–26—70.3.5 දින අංක 14,896 දරන ගැසට් පත්‍රය

---

## කණුකැටිය ගම්සභාව

### මුරකරු තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

**2.** වැටුප් ක්‍රමය.—වර්ෂයකට රු. 540—30×8, 24×1—රු. 804. රු. 636 සහ 732 යන වාර්ෂික වැටුප්වලට පළමු කාර්යක්ෂමතා කඩයිම් ඇත.

**3.** අවශ්‍ය සුදුසුකම් :—

(අ) 1970.3.25 වැනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු අවුරුදු 40 ට නොවැඩි විය යුතුය.

(ආ) අපේක්ෂකයෝ සිංහල V වැනි ප්‍රමාණයෙන් සමත්වී සිටිය යුතු අතර හොඳ ශාරීරික පෙනීමකින් යුක්ත විය යුතුය.

(ඇ) දැනට සේවයෙහි යෙදී සිටින්නන් ගැන විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

**4.** පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බල මණ්ඩලවල සේවයේ නියුක්ත අයවලුන්ගේ අයදුම්පත්, ඔවුන් අනිත් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

**5.** මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් අදාළවන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

**6.** ඉල්ලුම් පත්‍ර, පත්කිරීම සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව, සාරානුකූලව පිළියෙළකොට 1970 මාර්තු 25 වැනි දිනට හෝ ඊට පළමු නුන්ගම, කණුකැටිය ගම්සභාවේ සභාපති වෙත ලැබෙන සේ එවිය යුතුය.

ඇල්. පී. ඩී. සිල්වා,
කණුකැටිය ගම්සභාවේ සභාපති.

කණුකැටිය ගම්සභාකාර්යාලය,
1970. 2. 25.

3–12—70.3.5 දින අංක 14,896 දරන ගැසට් පත්‍රය

### පළාත් පාලන සේවය

**කාර්යාල කාර්ය සහායක තනතුර—වැලිසර සුළු නගර සභාව**

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.— වර්ෂයකට රුපියල් 540—30×8—රු. 24×1—රු. 804—රු. 636 සහ රු. 732 යන වර්ෂික වැටුප් වලට පළමු කාර්යක්ෂමතා කඩයිම් ඇත.

3. අවශ්‍ය සුදුසුකම් :—

(අ) වයස : 1970 මාර්තු 20 දිනට වයස අවුරුදු 20 ට නොඅඩු 30ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල/දෙමළ 6 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුත්තාහ.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බල මණ්ඩලවල ස්ථිර සේවයේ සිටින සේවකයන්ගේ අයදුම් පත්‍ර ඔවුන් අතින් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම්පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට, 1970 මාර්තු 20 දිනට හෝ ඊට පළමු වැලිසර සුළුනගර සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි.

ඇන්ටන් අමරසේකර,
වැලිසර සුළුනගර සභාවේ සභාපති.

1970 පෙබරවාරි මස 8 වැනි දින,
වැලිසර සුළු නගර සභා කාර්යාලයේදීය.

3–11—70.3.5 දින අංක 14,896 දරන ගැසට් පත්‍රය

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### පළාත් පාලන සේවය

**III වැනි ශ්‍රේණියේ සරප් සහ කැෂියර්වරුන් බඳවා ගැනීමේ විභාගය, 1969. 5. 7**

ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල අනුව, පහත නම් සඳහන් අපේක්ෂකයින් III වැනි ශ්‍රේණියේ සරප් සහ කැෂියර් තනතුරුවලට පත්කිරීම සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් තෝරා ගන්නා ලදී :—

| | | |
|---|---|---|
| 1. කේ. ඩී. කරුණාරත්න | ... | අංක 474, "ගීතාංජලි", වැලිවිට, කඩුවෙල. |
| 2. ඒ. අරුනගිරිනාදන් | ... | වරාය වැලි සහ ආරක්ෂක සේවා සංස්ථාව, 232, ඇතුල් වරාය පාර, ත්‍රිකුණාමලය. |
| 3. පී. නවරත්නම් | ... | මන්නච්චි මනල්, වැල්වෙට්ටිතුරේ, |
| 4. ජී. ජේසුතවලන් | ... | එල්ලාලයි නැගෙනහිර, චුන්නාකම් |
| 5. කේ. කේ. රාජරත්නම් | ... | වඩ්ඩු නැගෙනහිර, සිතන් කර්නි. |
| 6. ඩී. එස්. ඩබ්. ඒකනායක | ... | "සමන් පාය", කාක්කාපල්ලිය. |
| 7. එම්. ලක්ෂමන් | ... | පහළ මොරගොල්ලෑව, බණ්ඩාරකොස්වත්ත. |
| 8. එස්. මානනසුරේන්තිරන් | ... | සුතුමාලයි දකුණ, මනිපායි. |
| 9. එම්. ඒ. ගුණරත්න | ... | නොම්මර 101/8, හියුම්ස් පාර, ගල්වඩුගොඩ, ගාල්ල. |
| 10. කේ. තිරුකේසන් | ... | මනිපායි දකුණ, මනිපායි. |
| 11. අයි. එස්. එච්. ආනන්ද | ... | ගොන්න, කොහිලගෙදර. |
| 12. ඩබ්. ඩී. පී. ද මැල් | ... | නොම්මර 14/7, පළමු පටුමග, උයන, මොරටුව. |
| 13. කේ. ස්වාමිනාදන් | ... | "කනේසවාසන්", ඉරුපාලයි හන්දිය, කෝපායි. |

මොවුන්ට වහාම පත්වීම් දීමට කොමිෂන් සභාව භාරගනු නොලැබේ. පුරප්පාඩු ඇතිවූවිට මොවුන්ට පත්වීම් ලබාදෙනු ලැබේ.

ඒ. බී. සමරජීව,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 පෙබරවාරි මස 19 දින,
තැ. පෙ. 530, කොළඹ.

3–19—70.3.5 දින අංක 14,896 දරන ගැසට් පත්‍රය

## අතුරු ව්‍යවස්ථා

එල්.ඩී.—බී. 233/40

### පුත්තලම නගරය—නගර සභා ආඥාපනත

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 153 හා 157 වැනි වගන්ති යටතේ පුත්තලම නගර සභාවේ විශේෂ කොමසාරිස් විසින් සම්පාදිතව, එම ආඥාපනතේ 154 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 පෙබරවාරි මස 12 වැනි දින,
කොළඹදීය.

අතුරු ව්‍යවස්ථා

1. පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

සබන් නිපදවීම.
කරවල පදම් කිරීම, වේලීම හෝ අයිස් දැමීම.
සතුන්ගේ හම් හෝ ඇට ගබඩා කිරීම.
යන්ත්‍රානුසාරයෙන් මිරිස් කුඩු කිරීම.
වී හෝ කුරක්කන් ඇඹරීම.
බීඩි නිපදවීම.
සුරුට්ටු නිපදවීම.
දුම්කොළ නිපදවීම හෝ ගබඩා කිරීම.
කපාපු පොල් නිපදවීම.
ලී ඉරුම් වළක් පවත්වාගෙන යෑම.
අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යාම.
දර ගබඩාවක් පවත්වා ගෙන යාම.
පොහොර නිපදවීම හෝ ගබඩා කිරීම.
පුවක් වේලා පදම් කිරීම.
තීන්ත හෝ වානිෂ් ගබඩා කිරීම.
සිමෙන්ති ගබඩා කිරීම.

2. පහත සඳහන් ව්‍යාපාර අන්තරාදායක ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

කොප්පරා නිපදවීම හෝ ගබඩා කිරීම.
යන්ත්‍රයක් හෝ සෙක්කුවක් මගින් පොල්තෙල් නිපදවීම.
ස්වර්ණාභරණ නිපදවීමේ ආයතනයක් පවත්වා ගෙන යාම.
මුද්‍රණාලයක් පවත්වා ගෙන යාම.
ගිනි ගෝනි ගබඩා කිරීම.
වී පාහින මෝලක් පවත්වා ගෙන යාම.
මෝටර් වාහන අළුත්වැඩියා කිරීම හෝ සර්විස් කිරීම සඳහා ස්ථානයක් පවත්වා ගෙන යාම.
බයිසිකල් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම.
ටයර් හා ටියුබ් වල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම.
සිසිල් බීම නිපදවීම.
වඩු කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යාම.
පොල් ලෙලි පෙඟවීම සඳහා වළක් පවත්වා ගෙන යාම.
භූමිතෙල් ගබඩාවක් පවත්වා ගෙන යාම.
ඩීසල් තෙල් ගබඩාවක් පවත්වා ගෙන යාම.
විදුලි කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යාම.
වාත්තු වැඩපොළක් හෝ කම්හලක් පවත්වා ගෙන යාම.
බෙලෙක් වැඩපොළක් පවත්වා ගෙන යාම.
පරණ ලෝහ ගබඩා කිරීම.
හිස් බෝතල් ගබඩා කිරීම.
ගෘහ භාණ්ඩ වෙළඳ පොළක් පවත්වා ගෙන යාම.

3. පහත සඳහන් ව්‍යාපාර අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

හුණු පිලිස්සීම, පදම් කිරීම හෝ ගබඩා කිරීම.
උළු හෝ ගඩොල් නිපදවීම.
බැටරි චාජ් කිරීම.
ඡායාරූප ශාලාවක් පවත්වා ගෙන යාම.

3–2—70.3.5 දින අංක 14,896 දරන ගැසට් පත්‍රය

එල්. ඩී.—බී. 7/66.

## බදුල්ල මහා නගර සභාව

### මහ නගර සභා ආඥාපනත

1957 අංක 15 දරන මහානගර සභා (සංශෝධන) පනතෙහි 10 වන වගන්තියෙන් සංශෝධිත (252 වන අධිකාරය වන) මහා නගර සභා ආඥාපනතේ 267 වන හා 272 වන වගන්ති යටතේ බදුල්ල මහා නගර සභාව විසින් සම්පාදනය කරනු ලැබ, ඒ ආඥාපනතේ 268 වන වගන්තිය යටතේ පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලදුව, උත්තර මන්ත්‍රී මණ්ඩලය සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් ස්ථිර කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
ස්ථිර ලේකම්,
පළාත් පාලන අමාත්‍යාංශය.

1970. 2. 19 වන දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථා

1. "බදුල්ලේ පොළ" නමින් හඳුන්වනු ලැබීමට නියමිත පොළක් සෑම පෝ දිනකම සහ සභාව විසින් නියම කරන දිනයක සභාව විසින් පැවැත්විය යුතු ය.

2 (1) කොමසාරිස් විසින් හෝ කොමසාරිස්ගේ බලය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් දරන්නෙකු හෝ එලෙස අවසර පත්‍රයක් දරන්නෙකුගේ සේවකයෙකු හෝ නියෝජිතයෙකු හැර වෙනත් කිසිම තැනැත්තෙකු විසින් අවසර පත්‍රයෙහි අන්තර්ගත කොන්දේසිවලට අනුකූලව හැර වෙනයම් ලෙසකින් පොළ පිහිටි භූමිය ඇතුළත කිසියම් වෙළඳ කඩ කාමරයක් හෝ ස්ථානයක් පාවිච්චි නොකළ යුතු ය.

(2) (1) දරන ඡේදය යටතේ නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයක්ම මෙහි 1 වැනි උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියට සාරානුකූල විය යුතු අතර, අවසර පත්‍රයෙහි නිශ්චිතව සඳහන් විය හැකි පරිදි දොළොස් මසකට වැඩි නොවන හෝ එක් මසකට අඩු නොවන කාල සීමාවක් සඳහා වලංගු විය යුතු ය.

3. පොළ පිහිටි භූමිය ඇතුළත වූ කඩ කාමරයක් හෝ ස්ථානයක් පාවිච්චි කිරීම සඳහා අංක 2 දරන අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් දරන සෑම තැනැත්තෙකු විසින්ම මෙහි දෙවැනි උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කර ඇති ප්‍රමාණ අනුව ගාස්තුවක් ගෙවිය යුතු ය.

4. අංක 3 දරන අතුරු ව්‍යවස්ථාව යටතේ ගෙවිය යුතු ගාස්තු එකතු කර ගැනීමට සභාව නිලධාරියෙකු නොයොදවන්නේ නම්, ගාස්තු එකතු කර ගැනීමේ අයිතිය අනුමත කරන ලද තැනැත්තෙකුට—

(අ) පෞද්ගලික ගිවිසුමක් මගින් ; හෝ

(ආ) ටැන්ඩර් කැඳවීමෙන් ; හෝ

(ඇ) ගාස්තුව එකතු කිරීමේ අයිතිය ප්‍රසිද්ධ වෙන්දේසියේ දැමීමෙන්

සභාව විසින් බදු දිය හැකි ය.

5. (1) අංක 2 දරන අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් දරන කිසිම තැනැත්තෙකු විසින් කොමසාරිස්ගේ ලිඛිත අවසරය රහිතව—

(අ) තම අවසර පත්‍රය වෙනත් කිසිම තැනැත්තෙකුට පැවරීම ; හෝ

(ආ) තමාට වෙන් කර දෙනු ලැබ ඇති කඩ කාමරයේ හෝ ස්ථානයේ කිසිම කොටසක් අතුරු බදු දීම ; හෝ

(ඇ) තමාට වෙන් කර දෙනු ලැබ ඇති කඩ කාමරයේ හෝ ස්ථානයේ යම් කොටසක් තමාගේ සේවකයෙකුට හෝ නියෝජිතයෙකුට හැර වෙනත් කිසිම කෙනෙකුට පාවිච්චි කිරීම සඳහා අවසර දීම

නොකළ යුතු ය.

6. පොළ පිහිටි භූමිය තුළ කිසිම තැනැත්තෙකු විසින් පෙ. ව. 6 ත් ප. ව. 6 ත් ඇතුළත—

(අ) පොළට පැමිණෙන කිසිම තැනැත්තෙකුගේ අත බලා ශාස්ත්‍ර කීම හෝ අත බලා ශාස්ත්‍ර කීම සඳහා ඉදිරිපත් වීම හෝ පලාපල කීම ; හෝ

(ආ) කිසිම වර්ගයක බෙහෙත් හෝ ඖෂධ ප්‍රචාරය කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම ; හෝ

(ඇ) පොළට පැමිණෙන තැනැත්තන්ගෙන් පොළ අසළදී හෝ ඇතුළත දී මුදල් ආදිය හිඟා යැදීම ; හෝ

(ඈ) ගීත කාව්‍ය, සින්දු හෝ පොත් ප්‍රචාරය කිරීම, කියවීම, ගායනය කිරීම හෝ විකිණීම

නොකළ යුතු ය.

7. 2 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් දරන සෑම තැනැත්තෙකු විසින් ම පොළ පිහිටි ස්ථානය ඇතුළත පෙ. ව. 6 සිට ප. ව. 6 අතරතුර එළවළු, පළතුරු, මෙරට හාල්, වී, පොල්, සියඹලා, කොල්ලු, කුරක්කන්, ඇට වර්ග, ධාන්‍ය වර්ග, ඇට සහිත ගෙඩි වර්ග, අල වර්ග, හකුරු, අර්තාපල් අල හෝ වෙනත් වතු හෝ හේන් පලදාවන් විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම කළ නොහැකි ය.

8. (1) 2 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් දරන කිසිම තැනැත්තෙකු විසින්, පොළ පිහිටි භූමිය ඇතුළත කිසිම මස් වර්ගයක් විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නො කළ යුතු ය.

එසේ වුවද, එවැනි භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් විකිණීමට හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීමට කොමසාරිස් විසින් නිකුත් කරනු ලබන විශේෂ අවසර පත්‍රයක් මගින් ලබන බලය යටතේ විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම කළ හැකිය.

(2) එවැනි අවසර පත්‍රයක් නිකුත් කිරීමට සුදුසු වූද ප්‍රමාණවත් වූද හේතු ඇතැයි කොමසාරිස් සෑහීමට පත් නො වුවහොත්, විශේෂ අවසර පත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

9. 2 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද අවසර පත්‍ර දරන්නන් අතර හෝ එකී අවසර පත්‍ර දරන්නන්ගේ බලය ලත් සේවකයින් අතර හෝ ඔවුන් සහ මහජනයා අතර වෙළඳ පොළ පාවිච්චි කිරීම සම්බන්ධයෙන් ඇතිවන කිසියම් ආරාවුලක් කොමසාරිස් විසින් බලය පවරනු ලැබූ කිසියම් නිලධාරියෙකු විසින් රාජකාරියේ යෙදී සිටින කාලය තුළ එකී ආරාවුල පොළ පිහිටි භූමිය තුළදී නිරවුල් කළ හැකිය.

10. පොළ පිහිටි භූමිය තුළ සාමය පවත්වා ගැනීමේ කාර්‍යය සඳහා සභාව විසින් පත් කරනු ලබන සහ පොළ පිහිටි භූමිය තුළ රාජකාරියේ යෙදී සිටින නිලධාරියෙකු විසින් පොළ පිහිටි භූමිය තුළ සාමය පවත්වා ගත යුතු ය.

11. බඩු මිලදී ගැනීම සඳහා හෝ විකිණීම සඳහා පොළට පැමිණෙන සෑම තැනැත්තෙකු විසින්ම සභාවේ නිලධාරියෙකු විසින් හෝ පොලිස් නිලධාරියෙකු විසින් කිසියම් ආරාවුලක් නිරවුල් කිරීම සඳහා හෝ සාමය ආරක්ෂා කිරීම සඳහා දෙනු ලබන නීත්‍යනුකූල නියෝගයක් පිළිපැදිය යුතු ය.

12. කිසිම තැනැත්තෙකු පොළ පිහිටි භූමිය ඇතුළත—

(අ) කිසිම පිසිමක් ; හෝ

(ආ) අවිනීත අන්දමින් හැසිරීම, හෝ කිසියම් ශබ්දයක් හෝ කරදරයක් කිරීම, හෝ වෙනත් කිසිවෙකු සමග දබර කර ගැනීම, හෝ අපහාසාත්මක, නින්දාසහගත හෝ අවිනීත වචන පාවිච්චි කිරීම ; හෝ

(ඇ) සභාවේ නිලධාරියෙකු විසින් හෝ ග්‍රාමසේවක හෝ පොලිස් නිලධාරියෙකු විසින් හෝ කොමසාරිස්ගේ බලය යටතේ කටයුතු කරන ඕනෑම තැනැත්තෙකු විසින් හෝ ඉවත්ව යන ලෙස නියම කරනු ලැබීමෙන් අනතුරුවත් තව දුරටත් රැඳී සිටීමට සෑහෙන හේතු නොපෙන්වා රැඳී සිටීම හෝ සූනංගුවීම හෝ නොකළ යුතු ය.

13. (1) වෙළඳ පොළේ කිසියම් ස්ථානයක් හෝ කඩ කාමරයක් වෙනුවෙන් නිකුත් කරන ලද යම් අවසර පත්‍රයක් සම්බන්ධව යම් අතුරු ව්‍යවස්ථාවක් දෙවැනි වරටත් හෝ අනතුරුවත් උල්ලංඝනය කිරීම ගැන බලයලත් අධිකරණයක් විසින් අවසර පත්‍රය දරන්නා වැරදි කරු බව ඔප්පුකරනු ලැබූ විට වෙළඳ පොළේ ඒ ස්ථානය හෝ කඩ කාමරය වෙනුවෙන් වූ ඒ අවසර පත්‍රය එකී බලය ලත් අධිකරණය විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

(2) බලය ලත් අධිකරණයක් විසින් එසේ අවලංගු කරන ලද කලින් තිබූ අවසර පත්‍රය දැරූ කිසිවෙකුට 2 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ අවසර පත්‍රයක් නිකුත් කිරීම කොමසාරිස් විසින් ප්‍රතික්ෂේප කළ හැකි ය.

14. (1) කොමසාරිස්ට හෝ වෛද්‍ය නිලධරයාට හෝ කොමසාරිස්ගේ බලය යටතේ කටයුතු කරන ඕනෑම නිලධාරියෙකුට පොළ පිහිටි භූමිය ඇතුළත විකිණීම සඳහා ප්‍රදර්ශනය කොට ඇති ඕනෑම ආහාර ද්‍රව්‍යයක් ආහාර සඳහා යෝග්‍ය නොවන බව පෙනී ගිය හොත් කොමසාරිස් විසින් හෝ වෛද්‍ය නිලධාරියා විසින් කොමසාරිස්ගේ බලය යටතේ ක්‍රියා කරන යම් නිලධරයකු විසින් ඒ ආහාර ද්‍රව්‍ය පරීක්ෂා කොට තහනමට ගැනීම නීත්‍යනුකූල විය යුතුය.

(2) (1) වැනි ඡේදය යටතේ තහනම් කරන ලද කිසියම් ද්‍රව්‍යයක් ආහාරයට නුසුදුසු බව රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබුවහොත්, ඒ ද්‍රව්‍යය තහනම් කිරීමේදී එය අයිතිව තිබූ තැනැත්තාට වන්දියක් නොගෙවා ඒ ද්‍රව්‍යය විනාශ කළ හැකිය.

15. (1) කොමසාරිස් විසින් වෙළඳ පොළ පරිපාලනය කරනු වස් පත් කරන ලද නිලධාරියකු රාජකාරියේ යෙදී සිටියදී කිසිවකු විසින් ඔහුට විරුද්ධකම් කිරීම, අවහිර කිරීම, බාධා කිරීම හෝ හිරිහැර කිරීම නොකළ යුතුය.

(2) කුලී ගාස්තු අයකර ගනු වස් සභාව විසින් හෝ (කුලී ගාස්තු එකතු කිරීමේ අයිතිය බදු දී ඇති අවස්ථාවක නම්) බදු හිමියා විසින් හෝ පත් කරනු ලබන කිසිම තැනැත්තකු රාජකාරියෙහි යෙදී සිටියදී, කිසිවකු විසින් ඔහුට විරුද්ධකම් කිරීම, අවහිර කිරීම, බාධා කිරීම හෝ ගිරිහැර කිරීම නොකළ යුතු ය.

16. කිසිම තැනැත්තකු විසින්—

(අ) පොළ පැවැත්වෙන දිනයට පූර්ව දිනයෙහි ප. ව. 3 ට පෙර, පොළ පිහිටි භූමිය ඇතුළත කිසිම බඩුවක් හෝ වියන සහිත කිසිම ආකෘතියක් ඉදිකිරීම හෝ පැදුරු හෝ ගෝනි තැබීම ; හෝ

(ආ) පොළ පැවැත්වෙන දිනයට පසු දින පෙ. ව. 9 ට පසුව පොළ පිහිටි භූමිය තුළ කිසිම බඩුවක් හෝ වියන සහිත කිසිම ආකෘතියක් හෝ පැදුරක් හෝ ගෝනියක් හෝ වෙනයම් ද්‍රව්‍යයක් තැබීම

නොකළ යුතුය.

17. පොළ පැවැත්වෙන දිනයට පසු දිනයෙහි පෙ. ව. 9 ට පසුව පොළ පිහිටි භූමිය ඇතුළතවූ, ඉවත් නොකොට තබා ඇති යම් බඩුවක්, වියන සහිත කිසියම් ආකෘතියක්, පැදුරක්, ගෝනියක් හෝ වෙන යම් ද්‍රව්‍යයක් කොමසාරිස් විසින් හෝ කොමසාරිස්ගේ බලය යටතේ ක්‍රියා කරන සභාවේ වෙනයම් නිලධාරියකු විසින් ඉවත් කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

18. මෙම අතුරු ව්‍යවස්ථා අතුරෙන් කිසිවක් උල්ලංඝනය කරනු ලැබුවහොත් රුපියල් සියයකට නොවැඩි දඩයකින් දඬුවම් කළ හැකි විය යුතු අතර, බලය ලත් අධිකරණ උසාවියකින් වැරදිකරු බව ඔප්පු කරනු ලැබීමෙන් අනතුරුව හෝ කොමසාරිස් විසින් හෝ කොමසාරිස් විසින් බලය දෙනු ලැබූ යම් නිලධාරියෙකු විසින් එකී උල්ලංඝනය කිරීම ගැන අවධානය යොමු කරමින් ලිඛිත නිවේදනයක් භාර දෙනු ලැබීමෙන් අනතුරුව උල්ලංඝනය කිරීම අඛණ්ඩව කර ගෙන යන සෑම දිනයක් වෙනුවෙන්ම රුපියල් විසිපහකට වැඩි නොවන අතිරේක දඩයකින්ද දඬුවම් කළ හැකි විය යුතු ය.

19. මෙම අතුරු ව්‍යවස්ථාවල—

"කොමසාරිස්" යනුවෙන් සභාවේ නාගරික කොමසාරිස් අදහස් වේ ;

"සභාව" යනුවෙන් බදුල්ල මහා නගර සභාව අදහස් වේ ; තවද

"පොළ" යනුවෙන් බදුල්ලේ වෙළඳ පොළ අදහස් වේ.

20. 1935 ජනවාරි මස 25 වැනි දින අංක 8101 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ අතුරු ව්‍යවස්ථා අංක 18 දරන අතුරු ව්‍යවස්ථාව අවලංගු කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

### I වැනි උපලේඛනය

### බදුල්ල මහ නගර සභාව

අංකය : ..............................

දිනය .....................

බදුල්ලේ පොළ සම්බන්ධ බදුල්ල මහා නගර සභාවේ අතුරු ව්‍යවස්ථාවන්හි විධිවිධාන යටතේ පොළේ වෙළඳ කඩ කාමරයක/වෙනත් ස්ථානයක වෙළඳාම් කිරීම සඳහා අවසර පත්‍රය.

බදුල්ලේ..................පොළේ ද්‍රව්‍යයන් විකිණීමට හෝ විකිණීම සඳහා ප්‍රදර්ශණය කිරීමට ........................ පදිංචි ...................... .................. මහතාට/මහත්මියට/මෙනෙවියට, බදුල්ලේ නාගරික කොමසාරිස් .................................. වන මම මෙයින් බලය දෙමි.

මෙම අවසර පත්‍රය ............................ දක්වා වලංගුව පවතින අතර පසු පිටෙහි සඳහන් කොන්දේසිවලට යටත් විය යුතුය.

.............,
නාගරික කොමසාරිස්.

#### කොන්දේසි

1. මෙම අවසර පත්‍රය වෙනත් කෙනෙකුගේ නමට මාරු නො කළ යුතුය.

2. ඕනෑම දිනයක පොළේ වෙළඳ කඩ කාමරයක හෝ වෙනත් ස්ථානයක තබන ඕනෑම ද්‍රව්‍යයක් පිළිබඳ වගකීම අවසර පත්‍රය දරන්නා සතුය.

### II වැනි උපලේඛනය

| | දිනකට රු. ශ. |
|---|---|
| හතරැස් අඩි 24ක වර්ග ප්‍රමාණයක් ඇති භූමියක් සඳහා ... | 2 0 |
| හතරැස් අඩි 12ක වගී ප්‍රමාණයක් ඇති භූමියක් සඳහා ... | 1 0 |
| හතරැස් අඩි 6ක වගී ප්‍රමාණයක් ඇති භූමියක් සඳහා ... | 0 50 |
| හතරැස් අඩි 3ක වගී ප්‍රමාණයක් ඇති භූමියක් සඳහා ... | 0 25 |
| හතරැස් අඩි 3ට අඩු වගී ප්‍රමාණයක් ඇති භූමියක් සඳහා ... | 0 10 |

3–6—70.3.5 දින අංක 14,896 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන සහා ඡන්ද ආඥපනත යටතේ දැන්වීම්

### ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනත (262 වැනි අධිකාරය)

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනතේ (262 වැනි අධිකාරය වන) 66 (2) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අපේක්ෂකයින් ඔවුන්ගේ නම්වලට කෙලින් ඇති ඒ ඒ කොට්ඨාශයේ නියෝජිතයන් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත් කරන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1970 පෙබරවාරි මස 23 වැනි දින,
කොළඹ දී ය.

#### උපලේඛනය

| කොට්ඨාශ අංකය | | අපේක්ෂකයාගේ නම |
|---|---|---|
| **යාපනය දිස්ත්‍රික්කය** | | |
| **වටුකෝට්ටේ ගම් සභාව** | | |
| 9 | ... | වෙට්ටිවේට්පිල්ලේ යෝගීස්වරන් |
| **රත්නපුර දිස්ත්‍රික්කය** | | |
| **කුරුවිටි කෝරළේ මැද පත්තු ගම්සභාව** | | |
| 4 | ... | පහලගම් දුරගේ සයිමා |

3–30—70.3.5 දින අංක 14,896 දරන ගැසට් පත්‍රය

### ප්‍රාදේශීය බලමණ්ඩලීය ඡන්ද විමසීම්වල ප්‍රතිඵලවලට අදාල වූ සංඛ්‍යාති

1970 ජනවාරි මාසයේ දී පවත්වන ලද ඡන්ද විමසීම්වල ප්‍රතිඵලවල පහත දැක්වෙන විස්තර මහජනයාගේ දැන ගැනීම සඳහා ප්‍රසිඬ කරනු ලැබේ.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1970 පෙබරවාරි මස 22 වැනි දින,
කොළඹ දී ය.

#### මාතර දිස්ත්‍රික්කය

**ප්‍රාදේශීය බලමණ්ඩලයේ නම : හක්මන–වලකඩ ගම් සභාව** **ඡන්දය පැවැත්වූ දිනය : 1970.1.6**

| ඡන්ද කොට්ඨාශයේ අංකය සහ නම | ඡන්ද දයක සංඛ්‍යාව | ඡන්දපේක්ෂකයාගේ නම | ඡන්ද සලකුණ | ලැබූ ඡන්ද සංඛ්‍යාව | ප්‍රතික්ෂේප වූ ඡන්ද ගණන | ඡන්දය දුන් මුළු ගණන |
|---|---|---|---|---|---|---|
| 4 ... | 1471 ... | ඩී. ලියන ආරච්චි ... | ... අත ... | 578 | ... 5 ... | 712 |
| | | සමරසිංහ විජේසිරිවර්ධන බුද්ධදස ... | ... ඉනිමග ... | 129 | | |

## හම්බන්තොට දිස්ත්‍රික්කය

**ප්‍රාදේශීය බල මණ්ඩලයේ නම :** වලව ගම්සභාව **ඡන්දය පැවැත්වූ දිනය :** 1970.1.29

| ඡන්ද කොට්ඨාශයේ අංකය සහ නම | ඡන්ද දයක සංඛ්‍යාව | ඡන්දපේක්ෂකයාගේ නම | ඡන්ද සලකුණ | ලැබූ ඡන්ද සංඛ්‍යාව | ප්‍රතික්ෂේප වූ ඡන්ද ගණන | ඡන්දය දුන් මුළු ගණන |
|---|---|---|---|---|---|---|
| 9 | 1115 | වී. කේ. චන්ද්‍රසේන | පුටුව | 474 | 2 | 728 |
| | | ඩී. ඇම්. පී. අමරසේකර | සමනලයා | 252 | | |

## යාපනය දිස්ත්‍රික්කය

**ප්‍රාදේශීය බලමණ්ඩලයේ නම :** වටුකෝට්ටේ ගම් සභාව **ඡන්දය පැවැත්වූ දිනය :** 1970.1.29

| ඡන්ද කොට්ඨාශයේ අංකය සහ නම | ඡන්ද දයක සංඛ්‍යාව | ඡන්දපේක්ෂකයාගේ නම | ඡන්ද සලකුණ | ලැබූ ඡන්ද සංඛ්‍යාව | ප්‍රතික්ෂේප වූ ඡන්ද ගණන | ඡන්දය දුන් මුළු ගණන |
|---|---|---|---|---|---|---|
| 9 | 686 | වී. ගෝගීස්වරන් | කුඩය | 261 | 4 | 511 |
| | | කේ. මුරුගේසන් | කුකුළා | 177 | | |
| | | වී. කන්දයියා | තරාදිය | 69 | | |

## අම්පාර දිස්ත්‍රික්කය

**ප්‍රාදේශීය බලමණ්ඩලයේ නම :** උඩ පලාත ගම්සභාව **ඡන්දය පැවැත්වූ දිනය :** 1970 ජනවාරි 21

| ඡන්ද කොට්ඨාශයේ අංකය සහ නම | ඡන්ද දයක සංඛ්‍යාව | ඡන්දපේක්ෂකයාගේ නම | ඡන්ද සලකුණ | ලැබූ ඡන්ද සංඛ්‍යාව | ප්‍රතික්ෂේප වූ ඡන්ද ගණන | ඡන්දය ත් මුළු ගණන |
|---|---|---|---|---|---|---|
| 2 | 748 | නන්දසේන, ජී. එච්. | අලියා | 328 | 3 | 533 |
| | | විජයරත්න මහවෙල, ස. මු. වි. | අත | 193 | | |
| | | මුනිපේම, එම්. වයි. | තරාදිය | 9 | | |

## බදුල්ල දිස්ත්‍රික්කය

**ප්‍රාදේශීය බලමණ්ඩලයේ නම :** ඌව පරණගම ගම් සභාව **ඡන්දය පැවැත්වූ දිනය:** 1970.1.6

| ඡන්ද කොට්ඨාශයේ අංකය සහ නම | ඡන්ද දයක සංඛ්‍යාව | ඡන්දපේක්ෂකයාගේ නම | ඡන්ද සලකුණ | ලැබූ ඡන්ද සංඛ්‍යාව | ප්‍රතික්ෂේප වූ ඡන්ද ගණන | ඡන්දය දුන් මුළු ගණන |
|---|---|---|---|---|---|---|
| 7 | 273 | ඇන්. ඇම්. පුංචිබණ්ඩා | තරාදිය | 89 | — | 234 |
| | | කේ. ඇස්. ජූලිස් පෙරේරා | පුටුව | 61 | | |
| | | ආර්. ඇම්. පුංචි බංඩා | ලාම්පුව | 45 | | |
| | | පී. පී. අමරදස | කණ්නඩිකුට්ටම | 39 | | |

## මොණරාගල දිස්ත්‍රික්කය

**ප්‍රාදේශීය බලමණ්ඩලයේ නම :** කතරගම ගම් සභාව **ඡන්දය පැවැත්වූ දිනය :** 1970 ජනවාරි 29

| ඡන්ද කොට්ඨාශයේ අංකය සහ නම | ඡන්ද දයක සංඛ්‍යාව | ඡන්දපේක්ෂකයාගේ නම | ඡන්ද සලකුණ | ලැබූ ඡන්ද සංඛ්‍යාව | ප්‍රතික්ෂේප වූ ඡන්ද ගණන | ඡන්දය දුන් මුළු ගණන |
|---|---|---|---|---|---|---|
| 1—කතරගම | 357 | සොම්පාල තිඹලත් රත්නායක | ලාම්පුව | 178 | 1 | 299 |
| | | ගලප්පත්ති ටියුඩර්, ඒ. | අත | 102 | | |
| | | අදිකාරම් බණ්ඩාර | හාවා | 18 | | |

3-14—70.3.5 දින අංක 14,896 දරන ගැසට් පත්‍රය

---

# අය-වැය ලේඛන

## කැකිරාව සුළු නගර සභාව

**අංක 40 (II) දරණ සුළු නගර සභා මුදල් නියෝග යටතේ ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍රය**

## 1969 අය-වැය ලේඛනය

1969 වර්ෂය සඳහා ප්‍රතිපාදිත වැය ශීර්ෂයන්ගෙන් ඉතිරිවේයයි ගණන බලන ලද මුදල් භාවිතයෙන් අන්‍ය වැය සම්මතයන්හි අවශ්‍ය වියදම් පියවා ගැනීමට 1969 දෙසැම්බර් මස 28 වෙනි දින පවත්වන ලද කැකිරාව සුළු නගර සභාවේ සාමාන්‍ය මාසික සභා රැස්වීමේ අංක 9 දරණ යෝජනා ස්ථිරත්ව යෙන් පහත සඳහන් අන්දමට සම්මත කර ගන්නා ලදී :—

**පළමුවැනි කොටස—සාමාන්‍ය**

| ශේෂ වී ඇති මුදල් | රු. ශ. | අතිරේක ප්‍රතිපාදයන් | රු. ශ. |
|---|---|---|---|
| බී.—මංමාවත්— | | ඒ.—සාමාන්‍ය වියදම් :— | |
| (2) නඩත්තු කිරීම | 782 0 | (1) නිලධාරි වැටුප් | 45 0 |
| | | (එජ්) විශ්‍රාම වැටුප් | 40 0 |
| | | (ජී) ජීවනාධාර | — |
| | | (2) සංස්ථා වියදම්— | |
| | | (ජේ) හදිසි වියදම් | 500 0 |
| | | සී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි :— | |
| | | (8) ජීවනාධාර | 182 0 |
| | | ජේ.—කියවීම් ශාලා සහ පුස්තකාල :— | |
| | | (1) වේතන | 15 0 |
| | 782 0 | | 782 0 |

දෙවෙනි කොටස—විදුලි අංශය

| | රු. | ශ. |
|---|---|---|
| වි.දෙ. (2) ප්‍රතිසංස්කරණය සහ නඩත්තු— | | |
| (බී) යන්ත්‍ර සූත්‍ර බොයිලේරු සහ උපකරණ ... | 425 | 0 |
| | 425 | 0 |

| | රු. | ශ. |
|---|---|---|
| වි.දෙ. (1) විද්‍යුත්පාදනය— | | |
| (ඩී) විදුලි බලය මිලදී ගැනීම ... ... | 300 | 0 |
| වි.දෙ. (4) පාලනය හා සාමාන්‍ය වියදම්— | | |
| (බී) බාහිර සේවක වේතන හා දීමනා ... ... | 100 | 0 |
| (ඩී) විවිධ වැඩ ... ... ... | 25 | 0 |
| | 425 | 0 |

පී. ඩී. මහින්දසෝම,
සභාපති,
කැකිරාව සුළු නගර සභාව.

1970 පෙබරවාරි 22 දින,
කැකිරාව,
සුළු නගර සභා කායර්‍යාලයේ දීය.

3-28—70.3.5 දින අංක 14,896 දරන ගැසට් පත්‍රය

## පානදුර නගර සභාව

1969.12.26 වෙනි දින අංක 14,886 දරණ ගැසට් පත්‍රයේ පළවී ඇති මුදල් රෙගුලාසි අංක 12 (ii) යටතේ කෙරෙන අංක 3 දරන අයදුම් පතෙහි "මුදල් ඉතිරිවේයයි ගණන් බලා ඇති වැය ශීර්ෂ" යටතේ—ජී. සොහොන් භූමි—8. අතුරු දීමනාව යටතේ සඳහන් මුදල රුපියල් 4,000 ක් නොව රු. 400 ක් යනුවෙන් සහ "මුදල් වැඩිපුර වියදම් වේයයි ගණන් බලා ඇති වැය ශීර්ෂ" යටතේ 6—ආරෝග්‍ය ශාලා (උ) වේතන යන්න (ඒ) වේතන යනුවෙන් ද නිවැරදි විය යුතුයි.

වයිටස් ගුණතිලක,
සභාපති,
පානදුර නගර සභාව.

නගර සභා කාර්යාලය,
පානදුර, 1970.2.15 දින.

3-20—70.3.5 දින අංක 14,896 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## වලස්මුල්ල සුළු නගර සභාව

### ජලභීතිකා රෝගය

වලස්මුල්ල සුළු නගර සභා සීමාව තුල ජලභීතිකා රෝග උවදුර පවතින බැවින්, එම නගර සීමාව තුල පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නො වන්නා වූ අන්‍ය ස්ථානයක හෝ පාරක, හමුවන හෝ දඩාවතේ යන නැතහොත් බැඳ නො තබන්නා වූ හෝ දක්කා ගෙන නොයනු ලබන්නා වූ, කිසියම් සුනඛයකු (බල්ලකු හෝ බැල්ලියක) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයකු විසින් එ වේලෙහි විනාශ කරනු ලබන බව (ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වන පරිච්ඡේදය වන) ජලභීතිකා ආඥා පනතේ 11 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මෙම ප්‍රකාශන ගැසට් පත්‍රයේ පලවන දින සිට හය මාසයක කාලයක් බල පවත්වනවා ඇත.

ජී. එම්. එෆ්. ද සිල්වා,
වල්ස්මුල්ල සුළු නගර සභාවේ සභාපති.

1970 පෙබරවාරි 18 දා,
වලස්මුල්ල සුළු නගර සභා කායර්‍යාලයය,
වලස්මුල්ල.

3-5—70.3.5 දින අංක 14,896 දරන ගැසට් පත්‍රය

## වරකාපොල සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 වැනි අධිකාරයේ) 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බල තල ප්‍රකාර, නියමිත බලධාරි තැන වූද, වරකාපොළ සුළු නගර සභාවේ සභාපති තැන වූද, වඩුනොම්බි ආරච්චිලාගේ ඇල්බට් වන මම, 1970 වර්ෂයේ පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් දිනවල වරකාපොල නගර සීමාව ඇතුළත මස් පිණිස සතුන් මැරීම හෝ මස් වෙළඳාම් කිරීම සම්පූර්ණයෙන්ම මෙයින් තහනම් කරමි.

### උපලේඛනය

1970 මාර්තු 7, 15, 22, 30.
1970 අප්‍රේල් 6, 14, 21, 28.
1970 මැයි 5, 13, 20, 21, 28.
1970 ජූනි 4, 12, 19, 26.
1970 ජූලි 3, 11, 18, 25.
1970 අගෝස්තු 1, 9, 16, 23, 31.
1970 සැප්තැම්බර් 8, 15, 22, 29.
1970 ඔක්තෝබර් 4, 7, 14, 22, 29.
1970 නොවැම්බර් 6, 13, 21, 28.
1970 දෙසැම්බර් 5, 12, 20, 27.

ඩබ්ලිව්. ඒ. ඇල්බට්,
සභාපති,
වරකාපොල උප නගර සභාව.

1970.2.22 වෙනි දින,
වරකාපොළ උප නගර සභා කායර්‍යාලයේ දීය.

3-27—70.3.5 දින අංක 14,896 දරන ගැසට් පත්‍රය

## පුන්ඩලුඔය සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ (ගෝ ඝාතක) ආඥපණතේ 272 වැනි අධිකාරය

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 වැනි අධිකාරයේ) 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නියමිත බලධාරි තැන වූද, පුන්ඩලුඔය සුළුනගර සභාවේ සභාපති වූද, ඊ. පී. ඒ. ප්‍රැන්සිස් අප්පුහාමි වන මම, 1970 වර්ෂයේ පහත දැක්වෙන උපලේඛනයේ දක්වෙන දිනවල පුන්ඩලුඔය සුළුනගර සභා සීමා ඇතුළත මස් පිණිස සතුන් මැරීම හෝ මස් වෙළඳාම් කිරීම සම්පූර්ණයෙන්ම මෙයින් තහනම් කරමි.

### උපලේඛනය

1970 ජනවාරි 7, 15, 22, 30.
1970 පෙබරවාරි 4, 6, 14, 21, 28.
1970 මාර්තු 6, 7, 15, 22, 30.
1970 අප්‍රේල් 6, 14, 21, 28.
1970 මැයි 1, 5, 13, 20, 21, 28.
1970 ජූනි 4, 12, 19, 20, 26.
1970 ජූලි 3, 11, 18, 25.
1970 අගෝස්තු 1, 9, 16, 23, 31.
1970 සැප්තැම්බර් 8, 15, 22, 29.
1970 ඔක්තෝබර් 4, 7, 14, 22, 29.
1970 නොවැම්බර් 6, 13, 21, 28.
1970 දෙසැම්බර් 1, 5, 12, 20, 27.

ඊ. පී. ඒ. ප්‍රැන්සිස් අප්පුහාමි,
සභාපති,
පුන්ඩලුඔය සුළුනගර සභාව.

1970 පෙබරවාරි මස 20 වැනි දින,
පුන්ඩලුඔය සුළුනගර සභා කායර්‍යාලයේ දීය.

3-22—70.3.5 දින අංක 14,896 දරන ගැසට් පත්‍රය

## හන්වැල්ල පේරුව ගම්සභාව

ගම්සභා ආඥපනත—257 වන පරිච්ඡේදය

කොළඹ දිස්ත්‍රික්කයේ හන්වැල්ල පේරුව ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරන ලද පහත දැක්වෙන යෝජනාව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

සුගතන් එදිරිසිංහ,
හන්වැල්ල පේරුව ගම්සභාවේ සභාපති.

ගම්සභා කාර්යාලය, හන්වැල්ල,
1970 පෙබරවාරි මස.

### යෝජනාව

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සහා පොදු අතුරු ව්‍යවස්ථා ආඥපනතේ 3 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ හන්වැල්ල පේරුව ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් 1953 නොවැම්බර් මස 19 වැනි දින අංක 10,614 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද යෝජනාවෙන් සම්මත කරගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවන්හි 4 වැනි කාණ්ඩයේ 1 වැනි වගන්තියේ ප්‍රකාර මෙහි පහත දැක්වෙන මංමාවත් ඉදිරියේ සඳහන් දිග හා පළල ඇතිව සාද හෝ නැවත සාද පවත්වාගෙන යායුතු යයි යෝජනා කරන ලදී.

| කොට්ඨාශයේ අංකය හා නම | පාරේ නම | දිග සැ. | ප. | දා. | යා. | පළල අඩි |
|---|---|---|---|---|---|---|
| 1. හන්වැල්ල ඉහළ නැගෙනහිර | ගල්මුල්ල පාර | 0 | 6 | 0 | 13 | 16 |
| 1. හන්වැල්ල ඉහළ නැගෙනහිර | හන්වැල්ල හරස් පාර | 0 | 0 | 4 | 12 | 12 |
| 1ඒ. හන්වැල්ල ඉහළ බටහිර | පහත්ගම ගංගොඩ පාර | 0 | 3 | 1 | 18 | 14 |
| 1ඒ. හන්වැල්ල ඉහළ බටහිර | හවප්පුගෙවත්ත පාර | 0 | 3 | 6 | 8 | 14 |
| 1ඒ. හන්වැල්ල ඉහළ බටහිර | බෝධිම මාවත | 0 | 0 | 9 | 2 | 14 |
| 2. තුන්නාන | කුඩලුවිල පාර | 0 | 2 | 3 | 19 | 18 |
| 2. තුන්නාන | කෝන්ගහලන්ද පාර | 0 | 3 | 9 | 8 | 14 |
| 2. තුන්නාන | මහකන්ද පාර | 0 | 6 | 8 | 14 | 18 |
| 3. මාවතගම | ශාන්ති මාවත | 0 | 5 | 0 | 0 | 16 |
| 3. මාවතගම | ශ්‍රී සරණපාල මාවත | 0 | 3 | 3 | 7 | 14 |
| 4. හන්වැල්ල පහළ | කොන්නම්මගොඩැල්ල පාර | 0 | 2 | 6 | 11 | 16 |
| 4. හන්වැල්ල පහළ | වලව්වත්ත පාර | 0 | 5 | 1 | 11 | 18 |
| 4. හන්වැල්ල පහළ | ගංගොඩේ පාර | 0 | 2 | 7 | 19 | 14 |
| 4. හන්වැල්ල පහළ | කිරිගල පාර | 0 | 1 | 2 | 16 | 16 |
| 4. හන්වැල්ල පහළ | පන්සල පාර | 0 | 3 | 7 | 2 | 18 |
| 5. ආටිගල | ගොඩියකන්ද පාර | 0 | 3 | 6 | 8 | 14 |
| 5. ආටිගල | සිරිනිවාස පාර | 1 | 1 | 6 | 0 | 18 |
| 6. පානළුව | හිඹුටංමුල්ල පාර | 0 | 6 | 5 | 3 | 18 |
| 7. ගැහැණුවල-බැද්දෙගෙදරමුල්ල | දෙල්ගහවත්ත පාර | 0 | 3 | 0 | 6 | 14 |
| 9. ඕවිටිගම | නාගහවත්ත කළුවලදෙනිය පාර | 0 | 3 | 3 | 7 | 18 |
| 9. ඕවිටිගම | පුවක්වත්ත-හෙට්ටිගොඩ පාර | 0 | 1 | 9 | 15 | 18 |
| 10. වල්පිට-බටවල | ගංගොඩ පාර | 0 | 0 | 4 | 12 | 12 |
| 10. වල්පිට-බටවල | වල්පිට-ජල්තර පාර | 0 | 5 | 4 | 20 | 20 |
| 10. වල්පිට-බටවල | වල්පිට තැලුම්පිටියගොඩ පාර | 0 | 2 | 0 | 10 | 16 |
| 11. ජල්තර | මංකඩ හරස් පාර | 0 | 2 | 9 | 8 | 16 |
| 11. ජල්තර | ජල්තර-රනාල පාර | 0 | 4 | 0 | 20 | 16 |
| 11. ජල්තර | හේන්පිටගොඩැල්ල පාර | 0 | 2 | 5 | 16 | 16 |
| 11. ජල්තර | මංකඩ තොටුපල පාර | 0 | 0 | 3 | 0 | 12 |
| 8. වවරක | හල්කඳවත්ත පාර | 0 | 2 | 9 | 0 | 16 |

3–16—70.3.5 දින අංක 14,896 දරන ගැසට් පත්‍රය

---

## වේයන්ගොඩ සුළු නගර සභාව

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරය) 3 වැනි වගන්තිය යටතේ, වේයන්ගොඩ සුළු නගර සභාව විසින් සම්මත කර තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර, මෙයින් පළකර සිටිනු ලැබේ:—

### යෝජනාව

"පළාත් පාලන කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් සම්පාදනය කරනු ලැබ, 1953 නොවැම්බර් මස 6 වැනි දින අංක 10,609 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාවකින් අනුමත කරන ලද බව වර්ෂ 1954 මාර්තු මස 26 වැනි දින අංක 10,657 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයකින් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 16 දරන කාණ්ඩය මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවූ දින සිට සම්මත කර ගැනීමට වේයන්ගොඩ සුළු නගර සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ."

ඒ. කේ. ආර්. පෙරේරා,
වේයන්ගොඩ සුළු නගර සභාවේ සභාපති.

සුළු නගර සභා කාර්යාලය,
වේයන්ගොඩ,
1970 පෙබරවාරි 23 වැනි දින දීය.

3–8—70.3.5 දින අංක 14,896 දරන ගැසට් පත්‍රය

යොමු අංකය : එම්.ඊ/ඩී.සී./පී.එස්. 22/61

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 268 පරිච්ඡේදයේ 26 වන ඡේදය යටතේ පිළියෙල කරන ලද අවසාන වියදම කොටස් කිරීම

### කිරුළ පෙදෙස තැනීම—තිඹිරිගස්යාය දකුණ

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ (268 වන පරිච්ඡේදය) 26 (6) වන ඡේදය යටතේ අංක 13,490 සහ 1963 ජනවාරි 25 දින දරණ ලක් රජයේ ගැසට් පත්‍රයේ පල කරන ලැබූ නිවේදනයට අමතරව, කොළඹ නාගරික සභාව එකී පාර තැනීමෙන් පසුව ඒ පිළිබඳව අවසාන වියදම කොටස් කිරීම මෙහි පහත දනුම් දෙනු ලැබේ.

| තක්සේරු අංකය | විදියේ නම | අයිතිකරුගේ නම සහ ලිපිනය | තැනීමේ වියදම රු. ශ. | මලනාළිකා තැනීමේ වියදම රු. ශ. | වියදම කොටස් කිරීම රු. ශ. |
|---|---|---|---|---|---|
| 3 සහ 93 | කිරුළ පෙදෙස ... කිරුළ පාර ... | කේ. ඩී. එස්. අප්පුහාමි, 3, කිරුළ පෙදෙස, කොළඹ 5 එම | 310 68 | 755 90 | 1,066 58 |
| 5 සහ 5ඒ | කිරුළ පෙදෙස ... | සයිමන් එදිරිසිංහ, 40, අන්දරවත්ත පාර, කොළඹ 5 | 1,103 67 | 772 10 | 1,875 77 |
| 7 | කිරුළ පෙදෙස ... | ශ්‍රී උභයාත්‍රි සාධක සමිතිය, 7, කිරුළ පෙදෙස, කොළඹ 5 | 1,103 67 | 1,209 41 | 2,313 08 |
| 11 වත්ත | කිරුළ පෙදෙස ... | කහවවිදනලාගේ කළුනෝනා මිය., 11/7, කිරුළ පෙදෙස, කොළඹ 5 | 1,396 83 | 1,328 20 | 2,725 03 |
| 19 | කිරුළ පෙදෙස ... | කහවවිදනලාගේ දෝන වාලට් සිල්වා මිය., 11/8, කිරුළ පෙදෙස, කොළඹ 5 | 1,552 03 | 518 33 | 2,070 36 |
| 21 | කිරුළ පෙදෙස ... | ආර්. ගුණතිලක, 21, කිරුළ පෙදෙස, කොළඹ 5 | 2,948 86 | 4,519 23 | 7,468 09 |
| 31 | කිරුළ පෙදෙස ... | එම්. ඩී. මෙන්ඩිස්, 31, කිරුළ පෙදෙස, කොළඹ 5 | 2,569 47 | 1,360 61 | 3,930 08 |
| 6–32 සහ 101 | කිරුළ පෙදෙස ... කිරුළ පාර | නැසීගිය එම්. බී. මොහමඩ්ගේ දේපල භාරකරු වන එම්. ඒ. මොහමඩ්, 413, පරණ යොන් විදිය, කොළඹ | 10,674 50 | 6,057 95 | 16,732 45 |
| | | | 21,659 71 | 16,521 73 | 38,181 44 |

බී. ඒ. ජයසිංහ,
නාගරික කොමසාරිස්.

නගර ශාලාව,
කොළඹ 7, 1969.9.27.

3–17—70.3.5 දින අංක 14,896 දරන ගැසට් පත්‍රය

---

## හැටන්–දික්ඔය නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතෙහි (272 වෙනි අධිකාරය)

මෙහි පහත සඳහන් උප ලේඛනයේ දක්වෙන තැනැත්තා විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1970 පෙබරවාරි මස 22 වෙනි දින සිට 1970 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධව හැටන්–දික්ඔය නගර සභා ප්‍රදේශය ඇතුලත පදිංචි ඕනෑම කෙනෙකුට ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ නිසායයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් සිටින සේ මෙම දන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වෙනි අධිකාරයේ අංක 7 දරණ වගන්තිය ප්‍රකාර මෙයින් දනුම් දෙමි.

### උප ලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ඒ. සී. අසීස්, ඇම් ආර්. වචුන්, හැටන් | එළු මස් ... | හැටන් පොදු වෙළඳ පොලේ අංක 18 දරණ වෙළඳ සැල |

ඇම්. ජී. පී. ගුණවර්ධන,
හැටන්–දික්ඔය නගර සභාවේ
සභාපති.

1970 පෙබරවාරි මස 22 වැනි දින,
හැටන්–දික්ඔය,
නගර සභා කාර්යාලයයේ දීය.

3–13—70.3.5 දින අංක 14,896 දරන ගැසට් පත්‍රය

---

## අනුරාධපුර දිස්ත්‍රික්කයේ කහටගස්දිගිලියේ ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයේ 1970 වර්ෂය තුළ මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා බලපත්‍ර ඉල්ලා මා වෙත අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති බව (272 වැනි අධිකාරය වන) මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන ප්‍රදේශයේ යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, ඒ කුමණ කරුණක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපතක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වන දින සිට දින 14 ක් ඇතුළත දී මා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

### උපලේඛනය

| අයැදුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය හා වෙළඳාම |
|---|---|
| ඇන්. කුප්පනම්බි, තුරුක්කුරාගම, කහටගස්දිගිලිය | තුරුක්කුරාගම-කැබැති ගොල්ලෑව පාර, එළු හරක් මස් වෙළඳාම. |

ඩබ්. ඇම්. පියදාස උඩුල්දෙනිය,
සභාපති,
කහටගස්දිගිලිය ගම්සභාව.

1970 පෙබරවාරි මස 19 දින,
ගම්සභා කාර්යාලය,
කහටගස්දිගිලිය.

3–18—70.3.5 දින අංක 14,896 දරන ගැසට් පත්‍රය

## නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිඹුල ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳව ආඥාපනත-1970

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරයේ) 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල පරිදි නියමිත අධිකාරි තැනවූද, දිඹුල ගම්සභාවේ සභාපති වූද, කේ. පී. පීටර් වන මම 1970 වර්ෂය තුල පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති දිනයන්හි, නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිඹුල ගම්සභා ප්‍රදේශ සීමාව තුල මස් පිණිස සතුන් මැරීම සම්පූර්ණයෙන් තහනම් කරමි.

#### උපලේඛනය

1970 මාර්තු මස 7, 12, 22, සහ 30
1970 අප්‍රේල් මස 6, 14, 21, 28
1970 මැයි මස 5, 13, 20, සහ 28
1970 ජූනි මස 4, 12, 19 සහ 26
1970 ජූලි මස 3, 11, 18 සහ 25
1970 අගෝස්තු මස 1, 9, 16, 23 සහ 31
1970 සැප්තැම්බර් මස 8, 15, 22 සහ 29
1970 ඔක්තෝබර් මස 7, 14, 22 සහ 29
1970 නොවැම්බර් මස 6, 13, 21, 28
1970 දෙසැම්බර් මස 5, 12, 20 සහ 27
1970 ඔක්තෝබර් 4 වෙනි දින ලෝක සත්ව දිනයේදීද ඇතුලත්ය.

කේ. පී. පීටර්,
දිඹුල ගම්සභාවේ සභාපති.

දිඹුල ගම්සභා කාර්යාලය,
කොටගල, 1970. 2. 24

3–7—70.3.5 දින අංක 14,896 දරන ගැසට් පත්‍රය

---

## මීරිගම උඩුගහ ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වෙනි අධිකාරය)

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වෙනි අධිකාරයේ 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලය පරිදි නියමිත අධිකාරීතැන වූද, මීරිගම උඩුගහ ගම්සභාවේ සභාපති තැනවූද, ආර්. ඇම්. පී. පී. රාජපක්ෂ වන මම 1970 වර්‍ෂයේදී පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් වන දිනවල මීරිගම උඩුගහ ගම්සභා සීමාව ඇතුලත මස් පිණිස සතුන් මැරීම හෝ මස් වෙළඳාම් කිරීම සම්පූර්ණයෙන්ම මෙයින් තහනම් කරමි:—

#### උපලේඛනය

1970 ජනවාරි 7, 15, 22, 30
1970 පෙබරවාරි 6, 14, 21, 28
1970 මාර්තු 7, 15, 22, 30
1970 අප්‍රේල් 6, 14, 21, 28
1970 මැයි 5, 13, 20, 28
1970 ජූනි 4, 12, 19, 26
1970 ජූලි 3, 11, 18, 25
1970 අගෝස්තු 31, 1, 9, 16, 23
1970 සැප්තැම්බර් 8, 15, 22, 29
1970 ඔක්තෝබර් 7, 14, 22, 29
1970 නොවැම්බර් 6, 13, 21, 28
1970 දෙසැම්බර් 5, 12, 20, 27.

ආර්. ඇම්. පී. පී. රාජපක්ෂ,
සභාපති,
උඩුගහ ගම්සභාව, මීරිගම.

3–31—70.3.5 දින අංක 14,896 දරන ගැසට් පත්‍රය

---

## දඹුල්ල සුළු නගර සභාව

සුලු නගර සභා ආඥාපනතේ (256 වැනි අධිකාරය) 57 (3) දරණ වගන්තිය යටතේ දඹුල්ල සුලු නගර සභාව විසින්, මෙහි පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ විස්තර කරන පාරවල නම්, එහි 2 වැනි තීරුවේ සඳහන් පරිදි නම්කළ බවත්, මෙම නම්, 1970 ජනවාරි මස 28 වැනි දින සිට භාවිතා කරන බවත්, මහජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ:—

හෙ. වි. ප්‍රේමතිලක,
දඹුල්ල සුලු නගර සභාවේ සභාපති.

1970 පෙබරවාරි 22 වැනි දින,
දඹුල්ල සුලු නගර සභා කාර්යාලයේ දීය.

#### උපලේඛනය

| 1 වැනි තීරුව (පාරේ විස්තරය) | 2 වැනි තීරුව (පාරේ නම) |
|---|---|
| 1. දඹුල්ල-කුරුණෑගල පාරේ 4/92 දරණ බෝක්කුව අසළින් පටන් ගෙන, සිරි වලගම්බා පිරිවෙන දක්වා මාර්ගය | පිරිවෙන පාර |
| 2. දඹුල්ල-කුරුණෑගල පාරේ 92 සැතපුම් කණුව අසළින් පටන්ගෙන හලුඅපුල්ලන වැව දක්වා මාර්ගයේ යාර 200 ක් දිග කොටස | හලු අපුල්ලන වැව පාර |
| 3. දඹුල්ල-කුරුණෑගල පාරේ අංක 5/92 දරණ බෝක්කුව අසළින් පටන් ගෙන, අනුරාධපුර පාරේ බැරියර් එක අසළින් වැටෙන පාරේ යාර 200 ක් දිග කොටස | පෝරන්යාය පාර |
| 4. අනුරාධපුර පාරේ මූලික මිණුම් සලකුණ අසළින් පටන්ගෙන නිශ්ශංක මාවතේ 1/3 දරණ බෝක්කුව අසළට පාර | පළමුවැනි පටුමග |
| 5. අනුරාධපුර පාරේ 8/45 දරණ බෝක්කුව අසළින් පටන්ගෙන පහළ වැව දක්වා පාරේ යාර 200ක් දිග කොටස | පහළ වැව පාර |
| 6. අනුරාධපුර පාරේ අංක 7/45 දරණ බෝක්කුව අසළින් පටන්ගෙන මාතලේ පාරේ අංක 45/5 දරණ බෝක්කුව අසළට වැටෙන පාර | පාදෙනිය පාර. |
| 7. කිත්සිරි මාවතේ වරිපණම් අංක 200 දරණ ස්ථානයෙන් පටන්ගෙන රත්මලගහඇල දක්වා පාරේ යාර 200 ක් දිග කොටස | දික්යාය පාර |
| 8. කිත්සිරි මාවතේ වරිපණම් අංක 200 දරණ ස්ථානයෙන් පටන්ගෙන රත්මලගහඇල දක්වා පාරේ යාර 200ක් දිග කොටස | මහ යාය පාර. |
| 9. මාතලේ පාරේ අංක 5/45 දරණ බෝක්කුව අසළින් පටන්ගෙන රත්මල ගහඇල දක්වා පාරේ යාර 200ක් දිග කොටස | ඉලුක්යාය පාර. |
| 10. මාතලේ පාරේ අංක 2/45 දරණ බෝක්කුව අසළින් පටන්ගෙන රත්මල ගහඇල ගම දක්වා පාරේ යාර 200ක් දිග කොටස | රත්මලගහඇල පාර. |

3–15—70.3.5 දින අංක 14,896 දරන ගැසට් පත්‍රය

## තෙල්දෙණිය නගරය

(272 අධිකාරිය වන) සෝගාතන ආඥපනතේ 17(1) වැනි වගන්තියෙන් තෙල්දෙණිය නගරයේ විශේෂ කොමසාරිස් ලියන මුදියන්සේලාගේ සමරසිංහ වන මම, මා වෙත පැවරී ඇති බලය පරිදි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් වන දිනවලදී තෙල්දෙණිය නගර සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම මෙයින් තහනම් කරමි.

### උපලේඛනය

1970 ජනවාරි 7, 15, 22, 30.

1970 පෙබරවාරි 6, 14, 21, 28.

1970 මාර්තු 7, 15, 22, 30.

1970 අප්‍රේල් 6, 14, 21, 28.

1970 මැයි 5, 13, 20, 21, 28.

1970 ජූනි 4, 12, 19, 26.

1970 ජූලි 3, 11, 18, 25.

1970 අගෝස්තු 1, 9, 16, 23, 31.

1970 සැප්තැම්බර් 8, 15, 22, 29.

1970 ඔක්තෝබර් 4, 7, 14, 22, 29.

1970 නොවැම්බර් 6, 13, 21, 28.

1970 දෙසැම්බර් 5, 12, 20, 27.

ලි. මු. සමරසිංහ,
විශේෂ කොමසාරිස්,
තෙල්දෙණිය නගරය

විශේෂ කොමසාරිස් කාර්යාලය,
තෙල්දෙණිය නගරය,
තෙල්දෙණිය, 1969. 12. 28 දින.

3–21—70.3.5 දින අංක 14,896 දරන ගැසට් පත්‍රය

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

**1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. පෝය දින වලට පෙරදින පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වාද කාර්‍යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. පෝය දිනවලට පෙරදින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

**5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

**7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම් පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | | | | රු. | ශ. |
|---|---|---|---|---|---|
| අහලකට හෝ ඉන් අඩුව | ... | ... | ... | 20 | 0 |
| වැඩිවන සෑම අහලකට හෝ ඉන් කොටසකට | | ... | ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | | ... | ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | | ... | ... | 440 | 0 |

අහලේ සෑම කොටසකටම සම්පූර්ණ අහලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළකරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

**12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.**

**13. 68.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු—**

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | | | | මෙරට | | | පිටරට | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | ශ. | | රු. | ශ. |
| එක් කොටසක් | ... | ... | ... | 46 | 0 | ... | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් | | ... | ... | 36 | 0 | ... | 42 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් | | ... | ... | 43 | 50 | ... | 51 | 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.**

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | | | | මිළ | | | තැපැල් ගාස්තු මෙරට | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | ශ. | | රු. | ශ. |
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුලතදී එක කොටසක් | ... | ... | ... | 0 | 50 | ... | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් | ... | ... | ... | 1 | 00 | ... | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් | | ... | ... | 0 | 30 | ... | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් | | ... | ... | 0 | 60 | ... | 0 | 15 |

**දායක මුදල් භාර ගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් ධ්‍රැවමත් ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය

**1970**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම් සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| මාර්තු ... | 70. 3. 5 බ්‍රහස්පතින්ද | ... 70. 2.27 සිකුරාද | පෙ.ව. | 12.0 |
| | 70. 3.13 සිකුරාද | ... 70. 3. 5 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 3.20 සිකුරාද | ... 70. 3.13 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 3.26 බ්‍රහස්පතින්ද | .. 70. 3.19 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| අප්‍රේල් ... | 70. 4. 3 සිකුරාද | ... 70. 3.25 බදාද | ප.ව. | 3.30 |
| | 70. 4.10 සිකුරාද | ... 70. 4. 3 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.17 සිකුරාද | ... 70. 4. 8 බදාද | ප.ව. | 3.30 |
| | 70. 4.24 සිකුරාද | ... 70. 4.17 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.30 බ්‍රහස්පතින්ද | ... 70. 4.23 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| මැයි ... | 70. 5. 8 සිකුරාද | ... 70. 4.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 5.15 සිකුරාද | ... 70. 5. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.22 සිකුරාද | ... 70. 5.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.29 සිකුරාද | ... 70. 5.22 සිකුරාද | ප.ව. | 3.30 |
| ජූනි .. | 70. 6. 5 සිකුරාද | ... 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | ... 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | ... 70. 6.11 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | ... 70. 6.18 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.0 |

1970 මාර්තු 5 වැනි දින.
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි.